**ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරන ලදී. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපි වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(අ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ ඇවර අත්තිකාරම් ගිණුමේ වූ රු.2,158,234 ක කාරක පාඩුව ප්‍රතිපාදන ලබාගෙන සමාලෝචිත වර්ෂයේදී පියවා තිබුණත්, එම පියවීම අත්තිකාරම් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | - |
| (ආ) | ඉහත සඳහන් නිරීක්ෂණය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ගිණුමේ ශේෂය රු.1,045,475 ක වාසිගත ශේෂයක් විය යුතුව තිබුණත්, එය රු.1,112,755 ක අවාසිගත ශේෂයක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | - |

## 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | | | - |
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් | නිවැරදි කර පසුව ඉදිරිපත් කරමි. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනවල සඳහන් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.20,638,304 ක් වී තිබුණත්, එය රු.1,544,355 ක් වැඩියෙන් රු.22,182,659 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | |
| (ආ) | ඉහත සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශන අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු.168,057,463 ක් වී තිබුණත්, එය රු.145,464,733 ක් අඩුවෙන් රු.22,592,730 ක් ලෙස දක්වා තිබුණි. | - ඉහත පරිදි - | නිවැරදි කර පසුව ඉදිරිපත් කරමි. |
| (ඇ) | ඉහත නිරීක්ෂණ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සංඛ්‍යා ඇතුළත් නොකිරීම නිසා ශුද්ධ වත්කම්වල වටිනාකම (අවාසි) රු.147,419,158 ක් වී තිබුණත්, එය රු.410,070 ක සෘණ ශේෂයක් ලෙස දක්වා තිබුණි. | - ඉහත පරිදි - | - |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ ඉඩම් හා ගොඩනැගිලි 2018 වර්ෂයේදී තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණු අතර 2013 වර්ෂයේ තක්සේරු වාර්තා පදනම් කරගෙන ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් 2013 වර්ෂයෙන් පසු ගොඩනැගිලි සහ ගබඩා ඉදිකිරීම් සඳහා වැය කරන ලද රු.353,426,143 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම තුළ ඇතුළත් වී නොතිබුණි. | - ඉහත පරිදි - | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයෙහි ඇතුළත් කර තිබුණු හෙක්ටයාර 0.7145ක් වූ ඉඩම හා එහි ස්ථාපිත ගොඩනැගිලිවල වටිනාකම, අක්කර 1.5 ක්වූ ඉඩම් හා ගොඩනැගිලිද, හෙක්ටයාර් 8.42 ක්වූ ඉඩම් හා ගොඩනැගිලිද පැවතුණි. එම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී නව තක්සේරුවට අනුව ගිණුම් කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | එම වටිනාකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | | |
| (ඉ) | 2013 තක්සේරු වාර්තාවේ වේයන්ගොඩ ගබඩා සංකීර්ණය අක්කර 51ක භූමිභාගයක් පැවතුණි. එහි ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.350,470,000 ක් ලෙස ගණනය කර තිබුණි. එසේ වුවද, ඉන් අක්කර 10ක් (හෙක්ටයාර් 4.208) ක් රාජ්‍ය ආයතනවලට පවරා තිබීම නිසා අක්කර 40ක භූමි ප්‍රමාණයක් පමණක් දෙපාර්තමේන්තුව සතුව පැවතුණි. ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වේයන්ගොඩ ගබඩා සංකිර්ණයේ ඇතුළත් එම ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම නිවැරදි නොවීය. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි ප්‍රමාණය තක්සේරු කර ගිණුම්වලට ගත යුතුවීම. | තක්සේරු මණ්ඩලයේ තක්සේරුව අනුව ගිණුම් කටයුතු සිදුකර ඇති අතර, තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරුව අනුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | 2018 ජනවාරි 01 දිනට වෙනත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු.18,127,612 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ එය රු.3,455,744 ක් ලෙස දැක්වීම හේතුවෙන් වෙනත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු.14,671,868 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආරම්භක ශේෂයන් නිවැරදිව ගලපා ගිණුම්ගත කළ යුතුයි. | පසුගිය වර්ෂ ගණනාවක සිදුවූ භාණ්ඩ වෙන්දේසි මගින් ඉවත් කර හා පොත්වලින් කපාහැර ඇති ශේෂයන් හඳුනාගෙන ගිණුම් පොත් නිවැරදි කර ගැනිමට කටයුතු කළ නිසා මෙම වෙනස සිදුව ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහයේ ලැබීම් ලෙස රු.241,485,195 ක් වී තිබුණත්, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.11,099,262 ක් අඩුවෙන් රු.230,385,933 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | - |
| (ආ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට වැය කළ මුදල් ප්‍රවාහයේ තැන්පතු ගෙවීම් රු.23,915,197 ක් දක්වා නොතිබුණි. | - ඉහත පරිදි - | - |
| (ඇ) | අත්තිකාරම් කාර්යයන් වෙනුවෙන් වූ ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ ඇතුළත් කළ යුතුව තිබුණත්, අත්තිකාරම් ලැබීම් රු.7,877,884 ක් හා අත්තිකාරම් ගෙවීම් රු.7,999,920 ක් ඒ යටතේ දක්වා නොතිබුණි. | - ඉහත පරිදි - | - |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව පුද්ගල පඩිනඩි, මෙහෙයුම් වියදම්, සහනාධාර, මාරුකිරීම්, භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් වෙනුවෙන් රු.212,839,344 ක් වැය කර තිබුණද, එම වටිනාකම රු.12,937,665 ක් වැඩියෙන් රු.225,777,009 ක් ලෙස දක්වා තිබුණි. | - ඉහත පරිදි - | - |

**1.6.4 ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම්**
-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම 2004 දෙසැම්බර් 31 දිනට වසා දැමීමට හා ඈවර කිරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය යටතේ ඈවර කිරීමේ ඒකකයක් පවත්වාගෙන යන ලෙස 2003 දෙසැම්බර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකින් උපදෙස් ලබාදී තිබුණි. 2019 මැයි 31 දින වන විටත් ඈවර කිරීමේ ඒකකයක් පත්කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර එම ඈවර කටයුතු ආහාර කොමසාරිස්වරිය විසින් සිදුකර තිබුණි. එසේ වුවද, වසර 14 ක් ගතවී තිබුණත් ඈවර කිරීමේ කටයුතු නිමකර නොතිබුණු අතර, එම කටයුතු නිම කිරීමේ නිශ්චිත දිනයක් ප්‍රකාශ කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව දන්වමි. |
| (ආ) | 2002 හා 2003 වර්ෂවලදී රු.1,072,198 ක් වටිනා මෝටර් රථ 02 ක් කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයට හා සමුපකාර අමාත්‍යාංශයට භාරදී තිබුණි. එම වාහන භාරදී වර්ෂ 15 ක් ගතවී තිබුණත්, පැවරුම් අගයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේදී එම වටිනාකම විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත ලාභලාභ ගිණුමට හර කර තිබුණි. | සමුච්චිත ලාභලාභ ගිණුමට හර කිරීමට ප්‍රථම ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වීම | එකඟ වේ. අදාළ අගයන් අයකර ගැනීම සඳහා ආයතන දැනුවත් කළද එම ආයතන ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම නිසාද වාහන භාවිතා කිරීමේදී ක්ෂය වීම මත වත්කම් ඉවත් වන බවද උපකල්පනය කර ඈවර කිරීමේ මණ්ඩලයේ තොරතුරු සොයාගත නොහැකි වීම හේතුවෙන් අනුමැතිය රහිතව සමුච්චිත ලාභලාභ ගිණුමට හර කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 ජනවාරි 01 දිනට අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සංස්ථාවලින් අයවීමට තිබූ රු.88,501,884 ක් වූ සමාජ සේවා අධ්‍යක්ෂ නියං සහනාධාර ණයගැති වටිනාකම විධිමත් අනුමැතියකින් තොරව ඉකුත් වර්ෂයේදී සමුච්චිත ලාභලාභ ගිණුමට හර කර තිබුණි. ඒ අනුව සමුච්චිත අලාභය වැඩි වී තිබුණි. | සමුච්චිත ලාභලාභ ගිණුමට හර කිරීමට ප්‍රථම ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වීම. | එකඟ වේ. ශේෂයන් නිරවුල් කිරීම සඳහා දීර්ග කාලයක් තිස්සේ කටයුතු කළද ආයතන යහපත් ප්‍රතිචාර නොදැක්වීමත්, ගනුදෙනුවල තොරතුරු සොයා ගැනීමේ අපහසුතා නිසාත්, ඇවර කිරීමේ මණ්ඩලයේ තොරතුරු නොමැති වීම නිසාත් ගිණුම ඇවර කිරීම සරල කිරීම සඳහාත් මෙම සටහන් සිදු කළ බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ඉවත් කිරීමේ ගිණුම්වල ශේෂයක් නොතිබියදී පෙරවදන 04 හි වත්කම් උපලබ්දි වූ වටිනාකම ඉවත් කිරීමේ ගිණුමට බැර කර ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු නිවැරදිව පෙරවදනෙහි ඇතුළත් කළ යුතුවීම. | එකඟ වේ.<br>වසර 14 ක් පමණ දීර්ග කාලයක් තුළ මෙම ගිණුම් නිවැරදි නොවීම නිසාම ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි වුනි. අත්තිකාරම් ගිණුමේ පවතින වත්කම් දෙපාර්තමේන්තුව පාවිච්චි කරන නිසාත්, අත්තිකාරම් ගිණුමට අදාල ස්ථාවර වත්කම් ලේඛණය නිසි පරිදි පවත්වා නොමැති නිසාත් අදාල ක්‍රියාමාර්ගය ගත් බව දැනුම්දෙමි. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු ණයගැති ශේෂවල වටිනාකම රු.217,457,314 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සමූපකාර ණය ගැතියන්ගෙන් රු.645,170 ක් අයවී තිබුණු අතර තොග ණය ගැතියන්ගෙන් රු.1,636,746 ක් ආහාර කොමසාරිස්වරියගේ අනුමැතිය මත කපාහැර තිබුණි. අනෙකුත් ණය මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි. | අනෙකුත් ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එකඟ වේ.<br>ණය අය කර ගැනීම, පසු විපරම් කිරීම හා ප්‍රගති සමාලෝචනය කිරීම දුර්වල මට්ටමක පැවතීම නිසාත් ණය අය කර ගැනීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියා කිරීම සඳහා විධිමත් ලිපි ලේඛන නොමැති වීමත් නිසා ණය අයකර ගැනීම දුර්වල මට්ටමක පවතින බව දන්වමි. ඉදිරියේදී සමූපකාර සමිති කැඳවා සාකච්ඡා කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුව තිබුණි. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිගනිමි. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 06 වන ඡේදය | දෙපාර්තමේන්තුව සතු සියලු වත්කම් සම්බන්ධ තොරතුරු සහ 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද හා අපහරණය කළ වත්කම් සම්බන්ධයෙන් වූ තොරතුරු කොම්ප්ට්‍රෝලර් | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අදාළ වාර්තාවන් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

ජනරාල් කාර්යාලය වෙත 2019 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමූපකාර තොග වෙළඳ සංස්ථාව මඟින් ආනයනය කරන ලද සහල්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩා කිරීම හේතුවෙන් ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තුව වැය කළ රු.11,474,219 ක් 2019 මැයි 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් කඩිනමින් අයකර ගත යුතුවීම. | එකගවෙමි. ජීවන වියදම් කැබිනට් අනු කමිටුව විසින් ලබාදුන් නියෝගයට අනුව මෙම ගබඩා භාරදීමට කටයුතු කළ අතර, එහිදී මාස 03 ක සහන කාලයක් (කුලී රහිතව) ලබා දුන්නද, එම කාල පරිච්ඡේදය තුළ ගබඩා කළ සහල් බෙදා හැරීමට කටයුතු නොකිරීම නිසා කාලය දීර්ඝවීම මත ගබඩා කුලී ගණනය කිරීමට සිදුව ඇත. එම ආයතන කැඳවා මෙම ගැටලුව විසඳා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.30,080 ක්වූ ණය ශේෂය වර්ෂ 5 කට වැඩි | 2004 ඔක්තොබර් 24 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නිලධාරීන් සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බවත්, ඉදිරියේදී පොත්වලින් ලියා හැරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | කාලයක සිට පැවත එමින් තිබුණි. එම ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.213,581 ක් වූ වර්ෂ 5 ඉක්මවූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නිලධාරීන් සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බවත් ඉදිරියේදී පොත් වලින් ලියා හැරීමට කටයුතු කිරීම. |
| (ඇ) | 1999 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ මියගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.397,366 ක් වූ වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | - ඉහත පරිදි - | නිලධාරීන් සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බවත් ඉදිරියේදී පොත් වලින් ලියා හැරීමට කටයුතු කිරීම. |
| (ඈ) | වැඩ තහනම් කළ නිලධාරීන් 12 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 449,880 ක් වූ වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමර්ග ගෙන නොතිබුණි. | - ඉහත පරිදි - | නිලධාරීන් සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බවත් ඉදිරියේදී පොත් වලින් ලියා හැරීමට කටයුතු කිරීම |
| (ඉ) | සේවය අතහැර ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 910,474 ක් වූ වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | - ඉහත පරිදි - | නිලධාරීන් සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බවත් ඉදිරියේදී පොත් වලින් ලියා හැරීමට කටයුතු කිරීම |

## 2.3 තැන්පතු

---------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ------------------------ |
| තැන්පත් ගිණුම් 02 ක එකතුව රු.89,863,823 ක් තැන්පතු ශේෂ වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණද, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව එම තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එකගවෙමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 සැලැසුම් කිරීම

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | -------------------------- |
| (අ) | දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු කාර්යභාරයන්ගෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු නොවීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ලඟා කරගෙන නොතිබුණි. | දැක්ම හා මෙහෙවර ඉටු වන පරිදි කාර්යභාරය ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි දැක්ම හා මෙහෙවර සංශෝධනය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කර ගැනීමේ අරමුණින් සහල් ආරක්ෂිත තොග වශයෙන් පවත්වාගෙන යාම හා අපනයනය සඳහා යොමුවීමේ අපේක්ෂාවෙන් අවශ්‍ය ප්‍රමිතීන්ට යටත්ව දේශීය සහල් මිලදී ගැනීමේ ක්‍රියාව නැංවීම සඳහා වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයේ ගබඩා 06 ක් සහ ශ්‍රාවස්තිපුර, බූස්ස, මැද්දවත්ත ගබඩා 05 ක් නවීකරණය සඳහා 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දක්වා රු.380,262,779 ක් වැය | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | ආහාර දෙපාර්තමේන්තු සහල් මිලදී ගැනීමේදී ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා සතොස මගින් ආනයනය කරන ලද සහල් මෙම ගබඩාවල ගබඩා කිරිමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. එසේ වුවද, 2013 වර්ෂයේ නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය ඇගයීම සඳහා මෙට්‍රික් ටොන් 5,400 ක ධාරිතාවයකින් යුත් වේයන්ගොඩ අංක 10 ගබඩාවේ, ගබඩා කරන ලද මෙට්‍රික් ටොන් 668 ක සහල් තොගය අවසන් වීමෙන් පසුව 2014 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා ආහාර දෙපාර්තමේන්තුව සතුව කිසිදු ආරක්ෂිත සහල් තොගයක් ගබඩාවල නොතිබුණි. | | |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දින වන විට මෙට්‍රික් ටොන් 22,500 ක් ගබඩා කළ හැකි වන පරිදි වේයන්ගොඩ ගබඩා 06ක්ද, මෙට්‍රික් ටොන් 15,390 ක් ගබඩා කළ හැකි පරිදි ශ්‍රාවස්තිපුර, බුස්ස, මැද්දවත්ත ගබඩා 05 ක්ද නවීකරණය කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ගබඩා වලින් රජයේ ආදායමට නිසි දායකත්වයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම 2019 වර්ෂයේදී මෙම ගබඩා උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතයට ගැනීමේ හා රජයේ ආදායමට දායකත්වයක් ලබා ගැනීමේ සැලැසුම් සකස් කර නොතිබුණි. | ගබඩා උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතයට ගැනීමේ හා රජයේ ආදායමට දායකත්වයක් ලබා ගැනීමේ සැලැසුම් සකස් කළ යුතුවීම. | මෙම ගබඩාවන් 2018, 2019 හා 2020 වර්ෂවල ප්‍රතිපාදන කොටස් වශයෙන් ලබා ගෙන නවීකරණ කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අලුත්වැඩියා සිදුකර ඇත. මෙම ව්‍යාපෘතිවල වැඩකටයුතු 2020 වර්ෂයේදී අවසන් වන අතර, 2020 න් පසුව අපේක්ෂිත කාර්යයන් සඳහා යෙදවීමට බලාපොරොත්තු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන් 5 ට අනුගත වන සේ සහ එම කාර්යයන් ඉටුකර ගන්නා ආකාරයට ක්‍රියාකාරි සැලැස්ම සකස් කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට හා රජයේ ආදායමට දායකත්වයක් ලබාදීමට හැකිවන අයුරින් විද්‍යාත්මක ගබඩා උපයෝජනය කර ගැනීම පිළිබඳ සැලැසුම් ඇතුළත්ව ක්‍රියාකාරි සැලැස්ම සකස් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට අනුගත වන සේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුවීම. | දෙපාර්තමේන්තුව සතු සහල් ගබඩා කිරීමට සුදුසුවන පරිදි අලුත්වැඩියා කිරීම 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණි. දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් මනා කළමනාකරණයෙන් යුක්තව පවත්වා ගැනීමේ අරමුණින් සේවක පුහුණුවීම් 2018 වසරේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණි. දැක්ම, මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන් ඉටුකර |

| | | |
|---|---|---|
| | | ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ අරමුණින් වාහන, කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමද 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණි. |

**3.2** **වත්කම් කළමනාකරණය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ''ගොඩනැගිලි ගබඩා කිරීම සඳහා භාවිතා කරන්නේය'' යන පදනම මත තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කුලිය තක්සේරු කර තිබුණු බැලැක්පුල් ස්ටෝර්ස් අංක 01,02 හා 03 යන ගබඩා බදුකරුවන් විසින් ආහාර ගබඩා කිරීම හා සංචාරක නවාතැන් පහසුකම් සඳහාද භාවිතා කර තිබුණි. එසේම 2018 ජනවාරි 25 දින අත්සන් කරන ලද බදු ගිවිසුම්වල කොන්දේසි අනුව බදුකරු විසින් මෙම ගබඩා ආහාර ගබඩා කිරීම සඳහා යොදාගත යුතු වුවද, බදුකරු විසින් එම කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම අනුව කටයුතු කළ යුතුවීම. | සමිතිය සමඟ ගිවිසුම් ගතවී ඇත්තේ කුලි පදනම මත ගබඩාව ලබාදීමට පමණි. |
| (ආ) තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව බදුකරු විසින් භුක්ති විඳින භූමි ප්‍රදේශය වර්ග අඩි 6,426 ක්වූ ගබඩා 3 ක් ලෙස තක්සේරු කර තිබුණි. නමුත් භෞතික පරීක්ෂාවේදී අදාළ සමිතිය විසින් වර්ග අඩි 9,135 ක් භාවිතා කර තිබුණි. | - ඉහත පරිදි - | සමිතිය සමඟ ගිවිසුම් ගතවී ඇත්තේ කුලි පදනම මත ගබඩාව ලබාදීමට පමණි. |
| (ඇ) දෙපාර්තමේන්තුව සතුව පවතින ගබඩා 09 ක් 2014 සැප්තැම්බර් මාසයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ලංකා සතොස | හිඟ කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | ලංකා සතොස ආයතය 100%ක්ම රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වන බැවින් එම ආයතනයේ |

| | | | |
|---|---|---|---|
| | ආයතනය වෙත කුලීයට ලබාදීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ලෙස රු.21,700,546 ක් ද , බිම් රාක්ක සඳහා අයවිය යුතු මුදල් ලෙස රු.908,034 ක්ද වශයෙන් එකතුව රු.22,608,580ක් ලැබිය යුතුව පැවතුණි. | | කළමනාකාරිත්වය සමග මෙම හිඟ කුලිය නිරවුල් කර ගැනීම සඳහා සාකච්ජා කරමින් ඇත. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු ගබඩා 09 ක් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට කුලියට ලබාදී තිබුණු අතර ගබඩා කුලියට ලබාදීමේදී තැන්පතු මුදලක් ලබාගෙන නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ලෙස රු.22,716,858 ක්ද, ජලය හා විදුලිය සඳහා රු.3,486,060 ක්ද වශයෙන් එකතුව රු.26,202,918 ක් අයවිය යුතුව පැවතුනි. | හිඟ කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | එකගවෙමි. |

**3.3 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු ප්‍රමාණය රු.3,588,015,224 ක් වී තිබුණද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ එය රු.219,386,273 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පාඩු හා අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුව ඇත. | නැවත සකස් කර විගණනයට ඉදිරිපත් කර ඇත. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොළඹ 07, බාන්ස් පෙදෙසෙහි පිහිටි අක්කර 1.5 ක භූමිභාගයක වූ ඉඩමෙහි ගොඩනැගිලි 08 ක් පැවැති බව කො. | ඉඩම හා ගොඩනැගිලි ආර්ථික කාර්යයක | එකගවෙමි. පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට නොහැකි වීම. |

| | | | |
|---|---|---|---|
| | 8392 දරන මිනුම්පති වාර්තාවෙන් තහවුරු විය. 2007 මාර්තු 02 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එම ගොඩනැගිලි 8 හි මාසික කුලී වටිනාකම රු.1,002,500 ක් ලෙස තක්සේරු කර තිබුණි. ඉඩමේ තිබූ ගොඩනැගිලි සැලැසුම් සහගතව ඉවත් නොකිරීම හේතුවෙන් 2019 මැයි 31 දින වන විටත් එම දේපළ නිෂ්කාර්යව පැවතුණි. | යෙදිය යුතු වීම. | |
| (ආ) | 2014 සැප්තැම්බර් මාසයේ සිට 2016 පෙබරවාරි මාසය දක්වා වී අලෙවි මණ්ඩලය භාවිතා කළ ගොඩනැගිල්ලේ හිඟ ජල ගාස්තුව රු.473,871ක් බවත්, එම මුදල කඩිනමින් ගෙවීම් නොකළහොත් 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන මණ්ඩල පනත අනුව නීතිමය පියවර ගන්නා බවත්, 2018 ජුලි 16 දිනැති ලිපියෙන් ජාතික ජල සම්පාදන මණ්ඩලය, දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි. එම මුදල වී අලෙවි මණ්ඩලයෙන් අයකරගෙන ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත ගෙවීම් කිරිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් වී අලෙවි මණ්ඩලයෙන් අයකර ගෙන කඩිනමින් ගෙවීම් කළ යුතුවීම. | එකගවෙමි. පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට නොහැකි වීම නිසා පවරා දීමට නොහැකිව ඇත. |
| (ඇ) | 2010 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා අමාත්‍යාංශයේ නීති උපදේශකට ලබාදී තිබූ අනුමැතිය ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017 මාර්තු 09 දිනැති ලිපියෙන් 2017 මාර්තු 15 දින සිට අවලංගු කර තිබුණි. එසේ වුවද, විධිමත් අනුමැතියක් නොමැතිව 2017 මාර්තු 16 දින සිට 2018 සැප්තැම්බර් 30 දින දක්වා නීති නිලධාරි තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.101,158 ක් ගෙවා තිබුණි. | වැඩ බැලීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුව ඇත. | 2018.10.22 දින අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව දන්වා තිබුණි. |
| (ඈ) | රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් තොරව සහල් තොග වර්ෂයක් පමණ ගබඩා කර තැබීම සඳහා ආද්‍රතාවය පාලනය කරන ලද විද්‍යාත්මක ගබඩාවක් ලෙස නවීකරණය කරන ලද වේයන්ගොඩ | විශේෂිත කටයුත්තක් සඳහා අලුත්වැඩියා කරන ලද ගබඩාවන් භාහිර ආයතනවලට | එම ගබඩාවේ අයිස්මන් ටෙක්නොලොජීස් ආයතනය විසින් සවි කරන ලද යන්ත්‍ර හා විදුලි පද්ධතියේ දැනට පවතින |

| | | | |
|---|---|---|---|
| | ගබඩා සංකීර්ණයේ අංක 08 ගබඩාව අර්තාපල් ගබඩා කිරීම සඳහා පාරිභෝගික සංගමයක් වෙත ලබා දී තිබුණි. වර්ග අඩි 28,860 ක් වූ මෙ.ටො. 5400 ක් ගබඩා කළ හැකි මෙම ගබඩාව රු.57,235,982 ක් වැය කර විද්‍යාත්මක ගබඩාවක් ලෙස නවීකරණය කර තිබුණි. එම ගබඩාව සහල් ගබඩා කිරීම සඳහා යොදා නොගෙන අර්තාපල් තොග ගබඩා කර තිබුණි. එසේ ගබඩා කර තිබුණු අර්තාපල් නරක් වීමෙන් ගබඩාව ඇතුළත සවිකර තිබූ යන්ත්‍ර හා උපාංග සියල්ලට ජලය කාන්දුවීමෙන් හානි වී තිබුණි. එම යන්ත්‍ර හා උපාංග හානියට පත්වී මාස 06 ක් ගතවී තිබුණත්, 2019 මැයි 31 දින වනවිටත් ගබඩාවේ අලාභය තක්සේරු කර එම අලාභය අදාළ ආයතනයෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලබාදීමේදී ගබඩාවේ පැවැත්ම පිළිබඳ අවධානය යොමු කළ යුතුව තිබුණි. | ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාවක් ලබා ගෙන ඒ සම්බන්ධව පරීක්ෂා කර ආහාර දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලෙස අයිසිමන් ටෙක්නොලොජීස් ආයතනයට පිටපත් සහිතව ඉංජිනේරු ඩිසයින් සෙන්ටර් වෙත දැනුම් දී ඇත. ඒ පිළිබඳව ඔවුන්ගෙන් ලද පිළිතුර මත අදාල සේවා පිරිවැය අඩුකර දෙන ලෙස හා ඉල්ලීම් කර ඇත. තවද, සියළු ගාස්තු COOPFED ආයතනයෙන් ප්‍රතිපූරණය කර දෙන ලෙසටද ඉල්ලීම් කර ඇත. |
| (ඉ) | 2017 වර්ෂයට පෙර ආපන ශාලාව බදු දුන් ආයතන හා පුද්ගලයින්ගෙන් 2018 සැප්තැම්බර් 30 දින වන විට රු.724,776 ක් අයවිය යුතුව පැවතුණි. එම මුදල් අයකර ගැනීමට 2019 මැයි 31 දින වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | කඩිනමින් හිඟ මුදල් අයකර ගැනීමට හා ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම. | 2018 සැප්තැම්බර් 30 දිනට අයවිය යුතු හිඟ මුදලින් රු.36,192 ක් අයවී ඇත. 2019.05.30 දිනට හිඟ මුදල රු.688,584 ක් වේ. නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අධිකරණ කටයුතු සිදු වෙමින් පවතී. |
| (ඊ) | 2008 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද මියන්මාර් සහල් අලෙවි කිරීමේ වැඩසටහන යටතේ පාරිභෝගික සමූපකාර සමිතියකින් රු.1,442,300 ක් අයවිය යුතුව පැවතුණි. | බාහිර පාර්ශවයන් වෙත ගබඩා ලබා දීමේදී කාලානුරූපීව බදු කුලිය අයකර ගැනීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් තිබිය යුතු වීම. | එකගවෙමි. 2018 වර්ෂයේදී රු.ලක්ෂ 05 ක මුදලක් අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (උ) | පාරිභෝගික සමූපකාර සමිතියක් විසින් පරිහරණය කරන ලද ගබඩා 03 ක් සඳහා එකතුව රු.1,029,624 ක් අයකර ගැනීමට 2008 වර්ෂයේදී නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණද, 2019 මැයි 31 දින වන විටත් අදාළ හිඟ කුලී ආදායම් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ගබඩා ලබා දීමේදී පොදු නීති රීති මාලාවක් පිළියෙල කළ යුතු වීම. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඌ) | ඔරුගොඩවත්ත ගබඩා සංකීර්ණයේ අංක 02 ගබඩාව හා අංක 12 ගබඩාවේ 1/3 ක්, බිම් රාක්ක හා බිම් තරාදි 03 ක් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින සමූපකාර සමිතියක උප සමාගමක් වෙත ගබඩාව ලබාදී තිබුණි. එසේ ගබඩාව ලබා දිය යුතු ආයතනය, කාල සීමාව, ඉඩ ප්‍රමාණය හා ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳව සඳහන් නොවූ අවිධිමත් ලිපියක් පදනම් කරගෙන තැන්පතු මුදලක් ලබා නොගෙන එම ගබඩාව සමාගම වෙත අවිධිමත් ලෙස ලබාදී තිබුණි. එම ගබඩාව සමාගම වෙත ලබාදීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු.1,941,000 ක්වූ ගබඩා කුලියක් අහිමිවී තිබුණි. ගබඩාව ලබාදීමේදී සමූපකාර සමිතියෙන් වර්ෂ 10 ක කාලයක සිට හිඟහිටව පැවති මුදල් හා ඒවා අයකර ගැනීමට පවරා ඇති නඩු සමථයකට පත් නොවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානයට යොමුවී නොතිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ගබඩා ලබා දීමේදී පොදු නීති රීති මාලාවක් පිළියෙල කර විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතු වීම. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (එ) | වේයන්ගොඩ අංක 02 ගබඩාව බදු ගිවිසුම් දීර්ග නොකර තැන්පතු මුදල් රහිතව 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පුද්ගලික සමාගමක් වෙතද, 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා තවත් සමාගමක් වෙතද, බදු දී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එම සමාගම්වලින් දෙපාර්තමේන්තුව වෙත රු.1,957,413 ක් අයවීමට පැවතුණි. කුලී මුදල් නොගෙවීම හේතුවෙන් පනවන ලද රු.1,196,460 ක්වූ දඩ මුදල් විධිමත් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ගබඩා ලබා දීමේදී පොදු නීති රීති මාලාවක් පිළියෙල කර විධිමත් පරිදි ගිවිසුම් වලට එළඹිය යුතු වීම. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම. |